2009 මැයි මස 1 වැනිදා ,

පීල් දිස්ත්‍රික්ක පාසල් මණ්ඩලයට අයිති පවුල් වෙතටයි,

පීල් දිස්ත්‍රික්ක පාසල් මණ්ඩලය විසින් H1N1 ෆ්ලු වෛරසය (හියුමන් සුවයින් ඉන්ෆ්ලුඑන්සා) පැතිරීම වැළැක්වීම සඳහා සියලු පියවර ගෙන ඇති බවට සහතික කරමු. මෙම අවස්ථාවෙදී පීල් පාසල් සාමාන්‍ය ලෙසට කිසිදු භාදාවක් නොමැතිව එදිනෙදා කටයුතු කරමින් පවති.

පීල් සෞඛ්‍ය සභාව මෙම ජාතන්තර වසංගතය පිලිබඳව පීල් දිස්ත්‍රික්ක පාසල් මණ්ඩලය දැණුවත් කරන අතර **මෙම අවස්ථාවෙදී පීල් දිස්ත්‍රික්ක පාසල් මණ්ඩලය විසින් කිසිම අමතර උත්සහයක් නොගන්නා ලෙසට අවවාද කර ඇත**. මෙම වසංගතය වැළැක්වීමට පීල් සෞඛ්‍ය සභාවෙ විශේෂ වෛද්‍ය අවවාද සහ මග පෙන්වීම් වලට අනුව අප පාසල් සියලූ කටයුතු ක්‍රියාත්මක කරමු.

පීල් සෞඛ්‍ය සභාව H1N1 ෆ්ලු වෛරසය පැතිරීම වැළැක්වීම සඳහා පහත සඳහන් පියවර ගන්නා ලෙසට අයදුම් කරමු.

- කහින සහ හොටු හුරන විට ටිෂු පාවිච්චි කරන්න. පසුව එම ටිෂු එක විසි කරන්න.
- කැස්ස හො හොටු හීරීමෙන් පසුව නිතරම සබන් දමා අත සොදන්න. ඇල්කොහොල් අඩංගු අත සොදනයන් පාවිච්චිය සුදුසුය.
- විෂභීජ පැතිරීම අඩු කිරීමට ඇස්, නාසය, සහ කට ඇල්ලීමෙන් වැළකෙන්න.
- ලෙඩ ඇති මිනිසුන් අතර ගැවසීමෙන් වැළකෙන්න.
- ඔබ අසනීපයෙන් පෙළෙනවානම් රැකියාවට හො පාසල් යාමෙන් වැළකෙන්න. රෝග ලක්ශන පෙන්නුම් කරනවානම් වහාම වෛද්‍ය අවවාද ගන්න.

සියලුම පීල් දිස්ත්‍රික්කයේ පාසල් විසින් නිසි ආකාරව අත සොදන ක්‍රමය පිළිබඳව සිසුවන් දැණුවත් කරන අතර වැඩි විස්තර සඳහා පහත සඳහන් වෙබ් අඩවිය බලන්න. **www.peelschools.org**

ඔන්ටෙරියෝවෙ වසංගතයක් ඇති වූ විට එය වැළැක්වීම සඳහා සම්පූර්ණ පියවර ලයිස්තුවක් භාෂා 25 කින් පීල් දිස්ත්‍රික්ක පාසල් මණ්ඩලය තුල ඇති අතර එය පහත සඳහන් වෙබ් අඩවියේ '*Get the Facts*' යටතේ බලන්න. **www.peelschools.org**

ඉහත සඳහන් වෛරසය පිළිබඳව වැඩි විස්තර සඳහා පීල් දිස්ත්‍රික්ක පාසල් මණ්ඩලයේ වෙබ් අඩවිය **www.peelregion.ca** හො මිසිසාගා හා බ්‍රැම්ටන් නගර වාසීන් 905-799-7700 දුරකතන අංකයටද සහ කැල්ඩන් නගර වාසීන් 905-584-2216 දුරකතන අංකයට සඳුදා සිට සිකුරාදා උදේ 8.00 සිට සවස 5.00 දක්වා කථා කළ හැකිය. විශේෂ වෛද්‍ය උපදෙස් සඳහා තමුන්ගේ වෛද්‍යවරයා වෙත හො 1-866-797-0000 දුරකත අංකයෙන් වෛද්‍ය උපදෙස් ගත හැකිය.

වැඩි විස්තර සඳහා මෙම වෙබ් අඩවිය බලන්න. **www.peelschools.org**



Jim Grieve
අධ්‍යාපන අධිකාරී



Janet McDougald
සභාපතිණිය